කොවිඩ්-19 වසංගතය හා සමානවම භයානක වන්නේ, වසංගතයක් සේ පැතිර යන කොවිඩ්-19 සම්බන්ධ සාවද්‍ය හෝ නොමග යවන සුළු පුවත් යැයි කීම මුසාවක් නොවේ. විශේෂයෙන්ම මාධ්‍ය මෙහිදී තමන් වාර්තා කරන කරුණු සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු සොයා බලා තහවුරු කරගැනීම අත්‍යාවශ්‍ය වේ.

"අයිවර්මෙක්ටින් ඖෂධයෙන් කොවිඩ්වලට පිහිටක්, මූලික පරීක්ෂණ සාර්ථකයි" යන සිරස්තලයෙන් යුතුව මව්බිම පුවත්පතේ (08/27) පුවත් වාර්තාවක් පළවී තිබිණි. එසේම පේරාදෙණිය සරසවියේ පශු වෛද්‍ය පීඨයේ මහාචාර්ය අශෝක දංගල්ල උපුටා දක්වමින් සම්පාදනය වී තිබූ එම පුවත් වාර්තාවෙන් වැඩිදුරටත් පැවසුණේ, රටවල් රැසක කොවිඩ් රෝගීන්ට මෙම ඖෂධය ලබාදෙන බව සහ ඉන් සාර්ථක ප්‍රතිඵල අත්ව තිබෙන බවයි.

මේ අතර, "මැක්කන්ට දෙන ඖෂධ කොරෝනා රෝගීනුත් බීලා" යන සිරස්තලයෙන් යුතුව දිවයින පුවත්පතේ (08/29) පළවූ පුවත් වාර්තාවක්ද මේ සම්බන්ධයෙන් තොරතුරු වාර්තා කර තිබිණි. එහි දැක්වී තිබුණේ සමාජ මාධ්‍ය ජාලා වල පළවන ඇතැම් අසත්‍ය පුවත් නිසා මෙරට පුද්ගලයින්ද සතුන්ගේ සිරුරේ මැක්කන් පාලනයට ලබාදෙන අයිවර්මෙක්ටින් ඖෂධය භාවිතා කර ඇති බවයි. එසේම කොළඹ වෛද්‍ය පීඨයේ පරපෝෂිතවේදය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය විශේෂඥ වෛද්‍ය සනත් සේනානායක මහතාව උපුටා දක්වමින් එම පුවත් වාර්තාවේ වැඩිදුරටත් සඳහන්ව තිබුණේ, මෙම ඖෂධ මිනිසුන්ට ලබාදීම පිළිබඳව මෙතෙක් සායනික වශයෙන් තහවුරු කර නැති බවයි.

මේ අතර එක්සත් ජනපදයේ ආහාර හා ඖෂධ අධිකාරිය විසින්, අයිවර්මෙක්ටින් කොවිඩ්-19 රෝගීන්ට ප්‍රතිකාර සඳහා භාවිතා නොකළ යුත්තේ මන්දැයි සඳහන් කර සිටී. එසේම, ලෝක සෞඛ්‍ය සංවිධානය මගින්ද උපදෙස් ලබාදෙන්නේ අයිවර්මෙක්ටින් ඖෂධය සායනික පරීක්ෂණ තුළදී පමණක් කොවිඩ්-19 සඳහා භාවිතා කරන ලෙසයි.

මෙවැනි අවස්ථාවක, යම් පුවත්පත් වාර්තාවකින් මෙම ඖෂධය

ඇමරිකාව වැනි රටවල් රැසක කොවිඩ් රෝගීන්ට ලබාදෙන බව සහ එය සාර්ථක බව පැවසීම හේතුවෙන්, තවත් පුද්ගලයින් එය අත්හදා බලන්නට යෑමේ අවදානමක් නැතිද? එසේ නම්, එම ඖෂධය සායනික පරීක්ෂණ සඳහා පමණක් භාවිතා කරන ලෙසින් ලෝක සෞඛ්‍ය සංවිධානය පවසන බවද දිවයින පුවත් වාර්තාවට ඇතුළත් විය යුතු නොවන්නේද?

මෙම සියළු කරුණු සමගින් බලන විට, වඩාත් නිවැරදි තොරතුරු පාඨකයාට ලබාදෙන පුවත් වාර්තාව මින් කුමක්ද?

මූලාශ්‍ර:

https://www.fda.gov/.../why-you-should-not-use-ivermectin...
https://www.who.int/.../who-advises-that-ivermectin-only...
https://si.rata.lk/17672/
https://satahan.blog/2021/08/25/invermectinefakedrug/

**#MediaEthicsSL #lka #sinhalanews #SundayDivaina #Mawbima**